නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 ஆம் மாடி, செத்சிரிபாய, பத்தரமுல்லை.
4 floor, Sethsiripaya, Battaramulla

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No : DDD/HO/MF/05

ඔබේ අංකය / உமது இல / Your No :

දිනය / திகதி / Date : 2015.03.25

## දිවිනැගුම ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2015/01

**දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමනාකරුවන් වෙත.**

**<u>දිවිනැගුම ප්‍රජා මූල බැංකු මගින් නව සහනාධාර ලැබීමට සුදුසුකම් ලබන අඩු අදායම් ලාභීන් සඳහා හඳුන්වා දෙන රු.100,000/- දිවිනැගුම දිරිය සවිය ණය යෝජනා ක්‍රමය</u>**

### 01. හැඳින්වීම :-

මේ වන විට දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකුවල සාමාජිකත්වය ලබා ඇති අතර, ඔවුනගේ ආර්ථික සංවර්ධනය හා ජීවනෝපාය වැඩි දියුණු කරගැනීම උදෙසා විවිධ ණය පහසුකම් ක්‍රියාත්මක කර ඇත.

එසේ වූවද, අලුතින් සහනාධාර ලැබිය යුතු පවුල් මේ වන විට හඳුනා ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමේ ජනතා සංවිධාන සම්බන්ධ කර ගනිමින්, නව වැඩපිළිවෙලක් විනිවිදභාවයෙන් යුතුව හඳුනාගැනීමට අදහස් කර ඇති අතර, එතෙක් එවැනි පවුල් වල සිටින අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කරගැනීමටද එමගින් ඔවුනගේ ආර්ථිකය බලගැන්වීමට ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට තීරණය කර ඇත.

මේ අනුව, නව සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන තුරු ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් තවදුරටත් ප්‍රවර්ධනය කරගැනීමට හෝ හඳුනාගත්, ඵලදායී ව්‍යාපෘතීන් සඳහා දිරිය සවිය වැඩසටහන යටතේ ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීමට තීරණය කර ඇත.

දිවිනැගුම දිරිය සවිය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම් ප්‍රජාමූල බැංකු අංශය විසින් 2015/02/25 දිනැති චක්‍ර ලේඛ අංක 2015/02,හා ඊට සංශෝධන ලෙස නිකුත් කල 2015/03/06 දිනැති චක්‍ර ලේඛ අංක 2015/02 (I) හා 2015/03/19 දිනැති චක්‍ර ලේඛ අංක 2015/02 (II) දරණ චක්‍ර ලේඛ මගින් දන්වා ඇත. එම සියලු චක්‍ර ලේඛ මෙමඟින් අවලංගු කරන අතර ඉදිරියේදී මෙම චක්‍ර ලේඛයේ සඳහන් උපදෙස් හා මග පෙන්වීම් අනුව කටයුතු කරන ලෙස දන්වා සිටිමි.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
| --- | --- | --- | --- | --- |
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைநகல்/Fax: | 011-2889002 | | 011-2873996 | 011-2887722 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

## 02. ණය පහසුකම් ලැබීමට සුදුසුකම් ලබන අය,

2.1. දිවිනැගුම සහනාධාර වැඩසටහන යටතේ අළුතින් සහනාධාර ලැබීමට සුදුසුකම් ලබන අඩු ආදායම්ලාභී පවුල් වලින් සුදුසුකම් ලබන අය අතරින් අලුතින් ණය මුදලක් ඉල්ලුම් කරන අඩු ආදායම් ලාභීන් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සාමාජිකත්වය ලබාගතයුතු අතර එහිදි රු.500 ක් වූ එක් කොටසක් මිලදීගෙන තිබීම ප්‍රමාණවත්ය.

2.2. අලුතින් ණය මුදලක් ඉල්ලුම් කරන සාමාජිකයින්ට අමතරව දැනටමත් දිවිනැගුම බැංකු ණය වැඩසටහන යටතේ ණය පහසුකම් ලබාගෙන සාර්ථකව ගෙවා අවසන් හෝ ගිවිසුම් ගත පරිදි ගෙවමින් පවතින අඩු ආදායම්ලාභීන් සඳහා ණය නිකුත් කල හැකි නමුදු දැනට පිටහිටි ණය මුදල එකවර ගෙවා අවසන් කල යුතුය.

2.3 දිවිනැගුම බැංකු ණය වැඩසටහන යටතේ ණය මුදලක් ලබාගෙන පැහැර හැර ණයලාභියකු නොවීම.

## 03. උපරිම ණය මුදල හා පොලී අනුපාතය.

3.1 උපරිම ණය මුදල රු.100,000/- ක් වේ.

3.2 වාර්ෂික පොලී අනුපාතය 4% ක් වේ. සමාන වාරික වශයෙන් ණය ආපසු අය කර ගත යුතු අතර, ඒ සඳහා ගිවිසුම්ගත කාලය සඳහා වාර්ෂිකව පොලී ගණනය කර, ණය මුදලට එකතු කර ආපසු ගෙවීම් කාලයෙන් බෙදා මාසික වාරික මුදල සකස් කරගත යුතුයි.

උදා :- **රු:100000 x 4/100 x 3/36**

3.3 ආපසු ගෙවීම් කාලය මාසික වාරික 36 (අවුරුදු 03) ක් වන අතර සහන කාලයක් හිමි නොවේ. ව්‍යාපෘතියේ සක්‍යතාවය අනුව ණය අයදුම්කරුගේ එකඟතාවය ඇතිව ආපසු ගෙවීමේ කාලය අඩු කර ගැනීමට ඉඩ දිය හැක.

3.4 මෙම ණය වැඩසටහන යටතේ එක් සාමාජිකයකුට ණය නිකුත් කල යුත්තේ එක් වරක් පමණි.

3.5 ප්‍රජා මුල බැංකු අංශය විසින් ,මේ සඳහා සහන පොළි බැංකුවට ලබා දිම සිදු නොකෙරේ.

## 04. ණය ලබාදෙන ව්‍යාපෘති.

දැනට ක්‍රියාත්මක හෝ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සුළු කර්මාන්ත, සේවා, වෙළද, කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ධීවර වැනි ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් සඳහා ණය නිදහස් යුතුය.

## 05. ඉදිරිපත් කළයුතු ඇප සුරකුම්

මෙම ණය වැඩසටහන යටතේ පහත එක් ඇප සුරකුමක් මත ණය මුදාහැරීමට කටයුතු කළ යුතුය.

5.1 කුඩා කණ්ඩායම් ඇපය.

එහිදී අළුතින්ම කුඩා කණ්ඩායමකට ගොනුවන සාමාජිකයන් ඇතුළත් කණ්ඩායමක සමූහ තැන්පත් ගිණුමේ රු.2500/- ක මුදලක් තැන්පත් වී තිබීම ප්‍රමාණවත්ය. (එක් සාමාජිකයකුගෙන් රු.500/- බැගින්)

පැරණි කණ්ඩායමකට, නව සාමාජිකයකු ලෙස එකතු වී ණය ඉල්ලුම් කිරීමට ඉඩදෙන අතර, එවන් අවස්ථාවක අනෙකුත් සාමාජිකයන්ගේ කැමැත්ත මත රු.500/- ක මුදලක් තැන්පත් කිරීම ප්‍රමාණවත්ය.

5.2 දිවිනැගුම ප්‍රජා මූල බැංකුවෙහි ම, අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුමෙහි රු.10,000/- ඉක්ම වූ ශේෂයක් (ගිවිසුම් ගතවන දිනට) පවතින ගිණුම් හිමියන් දෙදෙනෙකුගේ ඇපය .

5.3 දැනටමත්, දිවිනැගුමප්‍රජාමූල බැංකුවෙහි රු.100,000/- ය ඉක්ම වූ ව්‍යාපෘති ණය ලබාගෙන ඇති සාර්ථක ව්‍යවසායකයන් දෙදෙනෙකුගේ ඇප සුරකුම ද ලබාගත හැක. එහිදී අදාල ඇපකරුවන්ගේ මාසික ආදායම රු.25,000/- ඉක්මවිය යුතු අතර, ඒ සම්බන්ධව බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

5.4 රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන් දෙදෙනෙකුගේ ඇප මත ද ණය නිදහස් කළ හැක. එවන් අවස්ථාවක ඇපකරුවන් තවදුරටත් රාජ්‍ය සේවයේ නිරතවීමට අවුරුදු 03 ක් ඉක්ම වූ සේවා කාලයක් (විශ්‍රාම යැමට පෙරාතුව) තිබිය යුතු අතර වැටුප් අවකරන සීමාව 40% ට වඩා අඩු විය යුතුය.

## 06. ණය ඉල්ලුම් පත්‍ර හා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

6.1 දිරිය සවිය ණය වැඩසටහන යටතේ මෙතෙක් නිකුත් කළ ණය සම්බන්ධයෙන් හදුන්වා දුන් ණය ඉල්ලුම් පත්‍රය හා ව්‍යාපෘති වාර්තාවෙහි ආකෘතිය හෝ බැංකු ණය වැඩ සටහන යටතේ භාවිතා කරන S6-1 ණය ඉල්ලුම් පත්‍රය හා ව්‍යාපෘති වාර්තාව උපයෝගි කරගෙන නිකුත් කළ ණය මුදල් සඳහා තව දුරටත් වලංගුවන අතර,මෙම චක්‍රලේඛය අනුව ණය නිකුත් කිරිමේදි බැංකු ණය වැඩසටහන යටතේ දැනට භාවිතා කරන S6-1 ණය ඉල්ලුම් පත්‍රය හා ඒ සමග ඇති ව්‍යාපෘති වාර්තාව දිරිය සවිය ණය වැඩ සටහන යටතේ ණය නිකුත් කිරිමේ දි භාවිතා කළ යුතුය.

6.2 දැනටමත් හදුන්වා දී ඇති ණය ගිවිසුම් පත්‍ර මෙම ණය වැඩසටහන සඳහා ද දී ඇති උපදෙස් පරිදි භවිතා කළ යුතුයි.

6.3 ණය තොරතුරු රෙජිස්තරය, ණය පාලන ලෙජර්, පුද්ගලික ණය ලෙජර් ලෙස හඳුන්වා දී ඇති ලිපි ද්‍රව්‍ය භාවිතා කළ යුතුය.

## 07. ණය සංරක්ෂණ හා සමූහ සංරක්ෂණ

7.1 ණය සංරක්ෂණය මෙම ණය වැඩසටහනට අදාල කළයුතු අතර, ඒ සඳහා දැනට පවතින උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

7.2 සමූහ සංරක්ෂණ වැඩසටහන මෙම වැඩසටහනට අදාල නොවේ.

## 08. ණය අනුමත කිරීම, මුදාහැරීම හා ගිණුම් ගත කිරීම.

8.1 දැනටමත් දිවිනැගුම ප්‍රජාමූල බැංකු ක්‍රමවේදය යටතේ ණය ඉල්ලීම් පරීක්ෂා කිරීම, නිර්දේශ කිරීම හා පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. කුඩා කණ්ඩායම් ඇපය ඉදිරිපත් නොවන විටක කුඩා කණ්ඩායම් නිර්දේශය ලබා ගැනීම අවශ්‍ය නොවේ.

8.2 මෙම ණය වැඩසටහන යටතේ බැංකු සාමාජිකයා (ණය අයදුම්කරු) හා ව්‍යාපෘතිකරු දෙදෙනකු වන අවස්ථාවක බද්ධ ණයක් ලෙස ගිවිසුම් ගත වී ණය මුදාහැරීමට කටයුතු කළ යුතු වේ. එහි දී සමීප ඥාති සම්බන්ධතාවය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක ස්ථානය වැනි සුවිශේෂ අංග දෙස ප්‍රායෝගිකව සොයාබලා ණය මුදාහැරීමට කළමණාකරු ක්‍රියාත්මක කළ යුතුය.

8.3 දිවිනැගුම බැංකු ජාලය හරහා ණය මුදාහැරීමේ දී වෙනත් මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය/ අත්තිකාරම් සඳහා ඇති බැඳීම් සොයාබැලීම වෙනුවට ණය අයදුම්කරුගෙන් වෙනත් ණය බැඳීම් පිළිබඳ සහතිකය ලබාගැනීම ප්‍රමාණවත් වේ. මෙම අවස්ථාව මෙම ණය වැඩසටහනට අදාල කර ගත්තේ ව්‍යාපෘති බලගැන්වීම කඩිනම් කිරීමට අවශ්‍ය බැවින්ය.

8.4 දිවිනැගුම ප්‍රජා මූල බැංකු වැඩසටහන යටතේ ණය ඉල්ලුම් කිරීමට බැංකු සාමාජිකත්වය ලබාගෙන මාස 03 ක් ඉක්මවීම යන කොන්දේසිය මෙම ණය වැඩසටහනින් ඉවත් කර ඇත. බැංකු සාමාජිකත්වයලබාගෙන සැනකින් ණය ඉල්ලුම් කිරීමට ඉඩ කඩ ඇත.

8.5 දිරිය සවිය ණය වැඩසටහන යටතේ අපගේ ණය සංස්කෘතියේ ණය පියවරයන් අනුගමනය කිරීම අවශ්‍ය නොවන අතර, පළමුව ණය මුදලක් ඉල්ලුම් කරන සාමාජිකයකුට වුවද රු.100,000 යේ ව්‍යාපෘති ණය මුදල මුදාහල හැක.

8.6 ණය මුදාහැරීමේ දී පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

| | | |
|---|---|---|
| **ලැබිය යුතු ණය ගිණුම - දිවිනැගුම දිරිය සවිය** | **-** | **හර (කේත අංක 3116)** |
| **සාමාජික තැන්පත් ගිණුම** | **-** | **බැර** |

ණය නිකුත් කිරීම සාමාජික තැන්පත් ගිණුමෙහි තැන්පත් කර, පාස් පොතෙහි සඳහන් කර ලබාදීමට කටයුතු කළයුතුය.

8.7 මාසික ණය වාරිකය හා පොලිය අය කරගැනීමේ දී පහත ප්‍රවේශන තැබිය යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| සාමාජික තැන්පත් ගිණුම | | | - | හර |
| ලැබිය යුතු ණය ගිණුම | - | දිවිනැගුම දිරිය සවිය | - | බැර (මාසික වාරික මුදල) |
| ලද පොලී - දුන් ණය ගිණුම | | | - | බැර (අයකරගත් පොලී මුදල) |

8.8 ප්‍රමාද කරන ණය වාරික සඳහා 5% ක දඩ පොලී අය කර ගැනීම හා කල්පසුවූ, පැහැර හැරි ණය සම්බන්ධ අපගේ මෙහෙයුම් උපදෙස් පරිදි ක්‍රියාකර අය කර ගත යුතුයි. වාරික ගෙවීමේ දී ප්‍රමාද වන වාරික සඳහා දඩ මුදලක් අය කරන බව ණය අයදුම්කරුවන් දැනුවත් කිරිම බැංකු කාර්ය මණ්ඩලය හා වසමේ දිවිනැගුම නිලධාරින් කළ යුතුය.

8.9 ණයලාභින් විසින් ධන ආයෝජන තැන්පතු ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යා යුතුය යන්න උපදෙස් මෙහි දී අදාල කර ගත යුතු නොවේ.

## 09. ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ඉල්ලුම් කිරීම

9.1 දිවිනැගුම දිරිය සවිය ණය වැඩසටහන යටතේ ණය මුදාහැරීමට අවශ්‍ය අරමුදල් දිවිනැගුම ප්‍රජාමූල බැංකු අරමුදලින් ලබාගත යුතුය. ණය තැන්පතු අනුපාතය ගණනය කිරීමේ දී අනිවාර්ය ඉතිරි කිරීම් ද ඇතුළත්ව සියළුම තැන්පත් ලබාගත යුතුය.

9.2 ඉහත ඡේද අංක 9.1 හි සඳහන් පරිදි ණය තැන්පතු අනුපාතය ගණනය කළවිට 80% ඉක්ම වූ අවස්ථාවල පමණක් ණය මුදාහැර අනතුරුව ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කළයුතුය.

9.3 මෙහෙයුම් උපදෙස් 9 හා ඊට එකතුවීම් හී පරිදි ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා දැනට බලපවත්වන 4% වාර්ෂික පොලී අනුපාතය අනුව ප්‍රජා මූල බැංකු සමිතියට ණය පහසුකම් ලබාදීම සිදු කරයි. ප්‍රජා මූල බැංකු සමිතිය ද වාර්ෂිකව 4% ක පොලියට දිවිනැගුම බැංකුවට ණය මුදාහැරීම කළ යුතුය. මෙම කාර්ය සමාජ සත්කාරයක් වශයෙන් සිතා කටයුතු කළ යුතුය.

9.4 දිවිනැගුම ප්‍රජා මූල බැංකු, ප්‍රතිමූල්‍ය ණය සඳහා පොලී ගණනය හීන වන ශේෂ ක්‍රමය සිදුකරන බැවින්, බැංකුවට කිසිදු අවාසිදායක තත්ත්වයක් සිදු නොවේ.

9.5 ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ඉල්ලුම් කිරීමේ දී පැහැර හැරි ණය අනුපාතය 10% හෝ ඊට වැඩි අවස්ථාවක වුවද, ණය ඉල්ලුම් කිරීමට හැක. මෙම පහසුකම මෙම ණය වැඩසටහනට පමණක් අදාල වන අතර, මෙම තත්ත්වය කඩිනමින් දුරු කරගැනීමට බැංකු කළමණාකරු කටයුතු කළ යුතුය.

## 10. ප්‍රගති වාර්තා සකස් කිරිම

10.1 මාසිකව පුද්ගලික ණය ශේෂ පිරික්සුම් ලබාගැනීම, ණය ප්‍රගති වාර්තා සකස් කර එවීම මීට පෙර ලබා දි ඇති උපදෙස් වලට අනුකූල විය යුතුය. ඒ සඳහා දැනට හඳුන්වා දී ඇති ආකෘති පත්‍ර භාවිතා කළ යුතුය.

**11.** මෙහි සඳහන් නොවන උපදෙස් හා මග පෙන්වීම් හැර අනිකුත් උපදෙස් සඳහා ණය මෙහෙයුම් චක්‍රලේඛ තව දුරටත් වලංගු කර ගැනීමට දන්වා සිටිමි.



එච්.සුමනපාල,

අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය - කා.දැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.ස.
3. සියලුම ප්‍රදේශිය ලේකම්වරුන්. - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
6. විගණකාධිපති - අ.ක.ස.
7. සියළුම කළමනකාරුවන්, දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති - අ.ක.ස.